# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1756/24 - 2012 මැයි 04 වැනි සිකුරාදා - 2012.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/15/08/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 3(1)(ඈ) වගන්තිය යටතේ, 2010.03.24 දින දරන නියෝගයෙන් එක් පාර්ශ්වයක් වශයෙන් කරන්දෙනිය, මඩකුඹුර, කොටවෙල පාර, අංක 177 හි කේ. එස්. විජේසේකර මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, නිදහස් චතුරශ්‍රය, තැ.පෙ. 2204 හි පිහිටි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.03.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 අප්‍රේල් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*එක් පාර්ශ්වයක් වශයෙන්*

කේ. එස්. විජේසේකර මහතා
අංක 177, කොටවෙල පාර,
මඩකුඹුර, කරන්දෙනිය.

(ඉල්ලුම්කරු)

*නඩු අංකය* : A–3326

*සහ*

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව,
තැ.පෙ. 2204,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(වගඋත්තරකරු)

අතර පවත්නා කාර්මික ආරාවුල පිළිබඳවයි.

**ප්‍රදානය**

ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වැනි පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනතේ (1957 අංක 62 හ අංක 4/1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික අණපනත් වල විශේෂ ප්‍රතිපාදන පනත්) වලින් සංශෝධිත 4(1) වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2010.03.24 දින මා පත් කොට මා වෙත පවරා ඇත.

බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා පැවති කරුණ වූයේ :-.

"ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ II බී ශ්‍රේණියේ රියදුරෙකු වශයෙන් සේවය කරමින් සිටිය දී කේ. එස්. විජේසේකර මහතා රිය අනතුරක් සම්බන්ධයෙන් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 20678 දරන 2004.09.17 දිනැති නඩු තීන්දුව මගින් නිදොස් කර නිදහස් කර තිබිය දී එම සංස්ථාව විසින් නැවත විනය පරීක්ෂණයක් පවත්වා 2003.12.10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රියදුරු III බී ශ්‍රේණියට පහත හෙලමින් අඩු වැටුප් පරිමානයට පිහිටුවීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වුනේ ද, යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද පිළිබඳ වේ" යන්නයි.

කාර්මික ආරවුල් පනතේ සම්පාදිත නියෝග සංග්‍රහයේ 21(1) නියෝගය පරිදි දෙපාර්ශවයේ විස්තරාත්මක ප්‍රකාශ කැඳවීමෙන් අනතුරුව පිළිතුරු හුවමාරු කරවා ගෙන සමථයක් සඳහා ඉඩ ලබා දුන් පසු සමථයක් නොමැති බව හෙළි වූ පසු විභාගය අරඹන ලදී.

පරීක්ෂණය ඇරඹීමේ දෙපාර්ශවයම නීතිඥ සහය ලබා ගෙන තිබුණි. මූලික සාක්ෂි හරස් ප්‍රශ්න, නැවත ප්‍රශ්න ඇසීමට අමතරව අවසානයේ දෙපාර්ශයටම ලිඛිත දේශන සඳහා ඉඩ ලබා දුනිමි. ඉල්ලුම්කාර පාර්ශවයේ මෙන්ම වගඋත්තරකාර ආයතනයේ නීතිඥ ප්‍රියන්ත ජයවර්ධන මහතාගේ ද ලිඛිත දේශන සහ සලකුණු කරන ලද ලේඛණ ප්‍රදානය සඳහා ගුරු කොට ගන්නා ලදී.

ඉල්ලුම්කරු ප්‍රථමයෙන් සිය නඩුව ඉදිරිපත් කලේය. ඔහු වගඋත්තරකාර ආයතනයේ 1985.12.02 දින IX වැනි ශ්‍රේණියේ රියදුරෙකු ලෙස බැඳුනු බවත්. ආයතනයේ රියදුරු කාර්යයෙහි යෙදී සිටි බවත්, එසේ සිටින අතරතුර 2003.12.10 දින දෙණියාය බලා රාජකාරි ගමනක යෙදී සිටිය දී ලි/ප අංක 252 -1153 දරන වෑන් රථය රත්ගම ප්‍රදේශයේ දී බහාලූ ප්‍රවාහනය කළ විශාල රථයක් හා ගැටුමෙන් ඉල්ලුම්කරුගේ රථයට විශාල හානියක් සිදු වූ බවත් එකී අනතුර සම්බන්ධයෙන් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නීති කෘත්‍යක් පැවති බවත් අනාවරණය කළේය. "පී 1 " වශයෙන් සලකුණු කරන ලද මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා පත්‍රය තමාට එරෙහිව ඉදිරිපත් වූ අතර වාහන දෙකෙහිම රියදුරු දෙදෙනාටම නඩු දෙකක් පැවරී තිබූ බවද හෙළි කලේය. ඉල්ලුම්කරු සලකුණු කොට ඉදිරිපත් කරන ලද "පී 2(බී)" අනුව තමාට එරෙහිව චෝදනාවන් සියල්ලටම අංක 20678 නඩුවේදී ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිදොස් කොට නිදහස් කර ඇති බව ද, එම නීති කෘත්‍යයේ දී රූපවාහිනී සංස්ථාවේ කාර්මික නිළධාරී නිරෝෂන් ජයසිංහ සහ රත්ගම පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ රෝහන දර්ෂන කුමාර යන අය ද සාක්ෂි ඉදිරිපත් කර ඇත. ජයසිංහ මහතාට අනුව සංස්ථාවේ රියදුරු තැන මාර්ගයේ නියම පැත්තේ රිය පැදවූ බවත්, ඔහුගේ නොසැලකිලිමත් භාවයක් නොපැවති බවත්. සාක්ෂාත් කොට ඇත. සාක්ෂිකරුවන් දෙදෙනාම හරස් ප්‍රශ්න වලට මුහුණ දී ඇත. බහාලූ ප්‍රවාහනය කරන ලද රථයෙහි රියදුරු ගරු අධිකරණයේ දී වරද පිළිගෙන ඇත. "පී 02 (ඒ)" ඒ බව සනාථ කරයි. ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවෙහි "පී 2 බී" අනුව "මෙම අනතුර වළක්වා ගැනීම සඳහා විත්තිකරු විසින් ගත යුතුව තිබූ පියවර මොනවාද යන්න එසේ ගැනීමෙන් චූදිත වැළකී ඇති බව පැමිණිල්ලේ සාක්ෂි මගින් තහවුරු නොකරයි. ඒ අනුව පැමිණිල්ල චූදිතට එරෙහිව නගා ඇති චෝදනාව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කොට නැති බව තීරණය කරමින් චූදිතට විරුද්ධව නගා ඇති චෝදනාවෙන් ඔහු නිදොස් කොට නිදහස් කරමි". යනුවෙන් ගරු මහේස්ත්‍රාත්තුමා සිය තීන්දුව ප්‍රකාශයට පත් කොට ඇත.

මෙම බේරුම්කරණයේ රියදුරු විජේසේකර මහතා සිරිම් සහිත තුවාල ලබා ඇත. වෑන් රථයේ දකුණු පස හා රියදුරු අසුන පැත්තේ දොරද හානියට පත්ව ඇත. යම් රියදුරෙකු අනතුරකට අත වනමින් ගමන් නොකරන අතර මාර්ගයෙන් ගමන් කරන විශාල වාහන කුඩා වාහන කෙරෙහි අඩු සැලකිල්ලක් දක්වන බව බොහෝ අනතුරු විමර්ශනයෙන් හෙළි වේ. මෙම රියදුරු තම ජීවිතය පරදුවට තබා කන්ටේනර් රථයේ වැදෙන සේ තම රථය ධාවනය නොකිරීම සාමාන්‍ය පුද්ගලයෙකු විසින් ගන්නා පියවරක් බව හැඟේ. එබැවින් මෙම අනතුරේ දී කන්ටේනර් රථයේ රියදුරු කුඩා වාහන කෙරෙහි එතරම් සැලකිල්ලක් නොදැක්වීම යන කරුණු මත ද ඔහුගේ නඩුවෙහි වරද පිළිගැනීම යන කරුණ ද සලකා බැලීමේ දී අනතුර සම්බන්ධව යම් ඉඟියක් ලද හැකිය. එකී කරුණු ද මෙම බේරුම්කරණයේ දී නොසලකා හැරිය නොහැක. වගඋත්තරකරුවන් මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුව දුන් පසු විනය පරීක්ෂණයකට යටත් කොට ඇත. එහි නිවැරදි භාවය ගැන සැක සහිත වේ.

2010.10.08 දිනැති බේරුම්කරණ කාර්ය සටහනෙහි 03 පිටුවෙහි මෙසේ දැක්වේ.

"ප්‍ර: ගරු අධිකරණයේ දී තිබෙන තීන්දුව "පී/01/ඒ" හි සඳහන් චෝදනා 02 ට නිදොස් කොට නිදහස් කර තිබෙන තීන්දුවට එරෙහිව තමයි මේ P/03/01 සහ 04 චෝදනා දෙකට ඔබව විනය පරීක්ෂණ වැරදිකාරයා කර තිබෙන්නේ ද?

උ : ඔව්.

ප්‍ර : විනය පරීක්ෂණයේ දී මේ අධිකරණය සැලකිල්ලට ගෙන තිබෙන්නේ කුමන ආකාරයට ද?

උ: අධිකරණයේ හැල්ලුවට ලක් කිරීමක්.

ප්‍ර : උත්තරීතර ආයතනයක් වන ගරු අධිකරණයෙන් දී තිබෙන තීන්දුවට පටහැනිව "P03" න් ඔබට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන චෝදනා පත්‍රයේ 01 හා 04 ට වැරදිකරු කිරීමට හැකියාවක් තිබෙනවාද?

උ: නැහැ.

ප්‍ර : එසේ කරනවා නම් එය ස්වාභාවික යුක්ති ධර්මයටත් පටහැනියි කියලයි තමන් කියා සිටින්නේ ද?

උ : ඔව්.

යන්නෙන් වගඋතරකරු තමාට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය සම්බන්ධයෙන් සඳහන් කරයි. එකී විනය පරීක්ෂණය අනුව තමන් දැරූ තනතුර පහත හෙළීමකට මෙන්ම සිය වැටුප් ශ්‍රේණිය අඩු කිරීමටත්, වෑන් රථයේ අලාභය වූ රු.120,000/- සහ වෑන් රථය කොළඹට ඇදගෙන ඒමට වැය වූ රු.12,500/- ක මුදල ද අය කර ගැනීමට විනය නියෝගයන්ගෙන් තීරණය කොට ඇති බවත්, සාක්ෂාත් කලේය.

එකී නියෝගයට එරෙහිව කරන ලද අභියාචනයේ දී වෑන් රථයට අලාභය වූ රු.120,000/- සහ එය කොළඹට ඇද ගෙන ඒම සඳහා වැය වූ මුදල ද අය කර ගැනීම අහෝසි කොට ඇත. අදාල වෑන් රථය රක්ෂණය කෙට තිබුන ද රක්ෂණ ක්‍රියාවේ යම් යම් අඩු පාඩු ඇති හෙයින් සිදු වූ අලාභය හානි පූරණය කර ගැනීමට නොහැකි වීම වගඋත්තරකාර ආයතනයේ වරදින් වූවක් බවද සාක්ෂිකරු ප්‍රකාශ කරයි.

වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ ප්‍රියන්ත ජයවර්ධන මහතාගේ හරස් ප්‍රශ්න වලට මුහුණ දුන් මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරු මෙසේ ප්‍රකාශ කර ඇත. 2010.12.14 දින කාර්ය සටහනෙහි 10 පිටුව අනුව අධිකරණරය මෙසේ විමසයි.

ප්‍ර: මෙම අනතුර සිදු වුනේ වාහනය අරගෙන අවුරුදු කීයකට පසු ද?

උ: අවුරුදු 05කට පසු සංස්ථාව කිසිම වාහනයක් වෙළඳ පොල වටිනාකමට රක්ෂණය කර නැහැ. ඩොල්පින් වාහනයක් ලක්ෂ 13කට ගත්තා. අවුරුදු 4-5කට පෙර ඒ කලයේ එහි වටිනාකම ලක්ෂ 30 ක් 35 වෙනවා. එම වාහනය ආයතනය ඒ ගණනට රක්ෂණය කර තිබුනේ නැහැ. එහෙම කර තිබුණා නම් වැඩිපුර ගණනක් ගන්න තිබුණා.

ප්‍ර: අනතුරක් සිදු වන අවස්ථාවේ තමා පැද වූ වාහනය වෙළඳ පොල අගය ලක්ෂ 30-35 කියාද තමා කියන්නේ.

උ: ඔව්. නමුත් එම ගණනට රක්ෂණය කර තිබුනේ නැහැ.

මේ අනුව වගඋත්තරකාර ආයතනය ද තම ආයතනයේ වාහන රක්ෂණය කිරීමේ වගකීම පැහැර හැර තිබූ බැවින් මෙම ඉල්ලුම්කරුට වැඩි අලාභයක් ගෙවීමට සිදු වී ඇති බව පෙනේ.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ජයන්ත ලාල් පෙරේරා මහතාගේ සාක්ෂිය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නියෝජිත මහතා විරෝධතාවක් ප්‍රකාශ කලේ එකී සාක්ෂිකරු විභාගය ආරම්භයේ සිටම ඉදිරිපත්ව සිටීමෙන් තම සේවාදායක වෙත අගතියක් වන බැවිනි, එයට වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා ඔහුගෙන් බලාපොරොත්තු වන්නේ ලේඛන කීපයක් ඉදිරිපත් කිරීම සඳහා පමණක් බව කියා සිටියේය. අධිකරණය ද ඔහුට ඉඩ දී ඇත්තේ ඔහුගේ සාක්ෂිය ප්‍රදානය දීමේ දී සැලකිල්ලට ගන්නා බව සටහන් කිරීමෙන් අනතුරුව වේ.

ඔහු විසින් විනය පරීක්ෂණය සම්බන්ධයෙන් සහ දඬුවම් සම්බන්ධයෙන් ද සාක්ෂි දුනි. සංස්ථාවේ විනය සංග්‍රහයක් තිබේ දැයි විමසීමට පිළිතුරු වූයේ ආයතන සංග්‍රහයේ 2 විනය කාණ්ඩය ප්‍රයෝජනයට ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇතැයි යන්න ද විචාරයෙන් පිලිගත යුතුව ඇත.

ප්‍ර: මම තමුන්ට යෝජනා කරනවා ආයතන සංග්‍රහයේ කිසිම තැනක සඳහන් කර නැහැ රියදුරෙකු හෝ ඕනෑම සේවකයෙකුගේ තනතුර පහත හෙලූ විට උපයා ගත් වැටුප අඩු කළ නොහැකි බවට තමන් එය පිළිගන්නවාද?

උ: අධ්‍යනයක් කර තමයි පිළිතුරු දිය හැක්කේ.

ඉල්ලුම්කරු වෙනුවෙන් අසන ලද ප්‍රශ්නයට ඍජුව පිලිතුරු දීමට මෙම සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) අපොහොසත් විය.

P7 වශයෙන් 2010.10.08 දින සලකුණු කරන ලේඛනය මැද කොළඹ සහකාර කම්කරු කොමසාරිස්තුමා විසින් රූපවාහිනී සංස්ථාවේ සභාපති අමතන ලද ලිපියකි. එහි "උක්ත කරුණ සම්බන්ධයෙන් 2007.11.07 දින පැවති පරීක්ෂණයේ දී දෙපාර්ශවයම ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගන්නා ලදී. එසේම ඉල්ලුම්කරු විසින් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම සිද්ධියට අදාල නඩු තීන්දුව, විධිමත් විනය පරීක්ෂණයට අදාල විනය නියෝග, රූපවාහිනී සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍රය සහ දඬුවම් පැමිණීම ආදී කරුණු සම්බන්ධව ආයතනය හා සේවකයා අතර හුවමාරු වූ ලිපි මා වෙත ඉදිරිපත් කර ඇත. එම කරුණු සැලකිල්ලට ගැනීමේ දී පැහැදිලි වන්නේ ආයතනයේ විනය කාර්ය සංග්‍රහක් නොමැතිව රජයේ නිලධාරීන්ට බලපවත්වන ආයතන සංග්‍රහයේ විනය රෙගුලාසි මත විනය පරීක්ෂණයක් පැවැත් වූ බවත්, ඒ අනුව දඬුවම් නියම කර ඇති බවත්ය" යන ඡේදයෙහි අන්තර්ගතය හා මම ද එකඟ වෙමි. වගඋත්තරකරුගේ සාක්ෂිකරු වූ සහකාර අධ්‍යක්ෂක පාලනගේ සාක්ෂියේ දී අනාවරණය වූයේ ආයතන සංග්‍රහයේ II කොටස අනුව දඬුවම් නියම කරන ලද බවයි. එකී සාක්ෂිකරුගෙන් වගඋත්තරකාර සංස්ථාව පාලනයවනුයේ රජයේ ආයතන සංග්‍රහය මත ද එසේත් නැත්නම් සංස්ථාවේ විනය රෙගුලාසි මත ද, එසේත් නැතිනම් සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ගනු ලබන තීරණ මත ද නැතහොත් ආයතන සංග්‍රහය හා අධ්‍යක්ෂ මණ්ඩලය වරින්වර ගනු ලබන තීරණ මත ද යන්න පැහැදිලිව කරුණු ඉදිරිපත් කර ගත නොහැකි විය. නමුත් මෙම ඉල්ලුම්කරුට දඬුවම් දීමේ දී ආයතන සංග්‍රහයේ II කාණ්ඩය ගුරු කොට ගත් බව පමණක් සාක්ෂාත් කර ඇත. P7 සහ මෙම කරුණු ද සැලකිල්කට ගත් කළ ආයතනයේ විනය පාලක සංග්‍රහයක් නොමැති බව පෙනේ.

"තව ද "P/7" ඒ නැමැති ඡේදය අනුව මෙම කාරනය පිළිබඳව ආයතනය අනුගමනය කර ඇති ක්‍රියා පටිපාටිය විනය කාර්ය සංග්‍රහයක් නොමැතිව ආයතන සංග්‍රහයේ විනය කාර්ය පටිපාටිය එම වගන්තීන් සමගව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවකයින්ට අදාල කර ගැනීමේ ක්‍රියා පිළිවෙත ගැටළු සහගත වේ. එසේම ඉල්ලුම්කරුට විනය පරීක්ෂණයකින් පසුව ලබා දී ඇති විනය දඬුවම් පිළිබඳව අනුගමනය කර ඇති ක්‍රියාපිළිවෙත ගැටළු සහගත වේ." යන්නෙන් සඳහන් වේ.

එදිනම සළකුණු කොට ඉදිරිපත් කරන ලද "P/7බී" ලේඛණය අනුව "විධිමත් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සහ විනය කාර්ය සංග්‍රහය සංස්ථාව තුළ සංස්ථාපනය කරන්නේ නොමැතිව මෙවැනි විනය පිළිබඳ කටයුතු පැවැත් වීමේ දී සේවක - සේව්‍ය දෙපාර්ශවයම ගැටළු සහගත තත්වයකට පත් වීම වැළැක්විය නොහැක." යනුවෙන් ආයතනයේ විනය කාර්ය සංග්‍රහයක් නොමැති වීම කෙසේ බලපාන්නේ දැයි පැහැදිලි වේ.

වගඋත්තර ආයතනයේ පැවති එක් දුර්වලතාවයක් ලෙස පැහැදිලි වූයේ :–

I. ආයතනය සතු වාහන නිසි රක්ෂණ ආවරණයකින් තොරව හා ඒවා තක්සේරු කිරීම යාවත්කාලීන කිරීමකින් තොරව පැවතීමය.

තවත් කරුණක් ලෙස පෙනෙනුයේ

II. ඉහතින් P/7, P/7ඒ, P7බී යන ලේඛණ වල අඩංගු කරුණු අනුව පෙනී යනුයේ ආයතනයේ නිසි විධිමත් විනය පාලන සංග්‍රහයක් නොමැති වීමය එය තවත් දුර්වලතාවයක්සේ දකිමි.

ආයතන සංග්‍රහයේ 27 : 11 ඡේදය අනුව "යම් නිලධාරියෙකු හට එරෙහිව අධිකරණයේ නීති කෘත්‍යයක් පවත්වා ගෙන යමින් තිබිය දී වුවද ඒ වරද මෙම සංග්‍රහය යටතේ වරදක් වන කල්හි විනය බලධරයා විසින් නිලධාරියාට විරුද්ධව අධිකරණ කටයුතු

වලට ස්වාධීන වශයෙන් දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයක් ද පවත්වාගෙන යා යුත්තේය." යන්නෙන් ප්‍රතිපාදන ඇත. මෙම ඉල්ලුම්කරුට එරෙහිව පැවති විනය පරීක්ෂණය ඉහත ඡේදයේ ප්‍රතිපාදනයන්ට එකඟ වන්නේ ද යන්න ද ගැටළු සහගත වේ.

"P3" වශයෙන් ලකුණු කරන ලද ලේඛණය අනුව මෙහි ඉල්ලුම්කරුට අධිකරණයෙන් නිදොස් හා නිදහස්ව තිබිය දී වගඋත්තරකාර පාර්ශවය චෝදනා පත්‍රයක් ඉදිරිපත් කොට "P4" අනුව විනය නියෝගයෙන් - චෝදනා පත්‍රයේ අංක 1-7 දක්වා සියළුම චෝදනා වලට ඉල්ලුම්කරු වැරදිකරු කරමින් " මෙම චෝදනා වලට බරපතලකම අනුව ඔබ සේවයෙන් පහ කළ යුතු වුවත් ඔබගේ අවුරුදු 20ක සේවා කාලය සලකා බලා සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් පහත දඬුවම් පනවනු ලැබේ." යනුවෙන් දක්වා ඇත, එනම්.

1. රිය අනතුර සිදු කළ 2003.12.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යොෂ්ඨත්වයෙන් පහළ දැමීම එනම් ඔබ රියදුරෙකු තනතුරේ දැනට සිටින 11ඒ (පූර්ව VI බී) ශ්‍රේණියේ සිට 111 බී (පූර්ව VII බී) ශ්‍රේණියට පහළ දමනු ලැබේ. ඒ අනුව මෙම ශ්‍රේණියට අදාල මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය රු.7285-165 X 17 - 10090 වන අතර එම වැටුප් පරිමාණයෙහි රු. 7285/- මාසික වැටුප් පියවරක පිහිටුවනු ලැබේ. 2004.12.01 දින නව වැටුප් සංශෝධනය අනුව ඔබගේ මාසික වැටුප් පියවර රු. 14,380/- වේ.

2. අංක 252-1153 දරන සංස්ථා වෑන් රථයේ අනතුර සම්බන්ධයෙන් රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්නය නොකරන ලද රු.420.000/- ක මුදල සහ එම වාහනය කොළඹට රැගෙන එම සඳහා දොඹකර ගාස්තු වශයෙන් වැය වී ඇති රු.12,500/- ක මුදල ඔබගේ වැටුපෙන් 40% අවකරණ සීමාවට යටත්ව අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

3. මින් ඉදිරියට වගකීමෙන් හා පරීක්ෂාකාරීව රිය ධාවනයේ යෙදීමට වගබලා ගන්නා සේ තරයේ අවවාද කරමි. යන රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2006.11.01 දින දණ්ඩන නියෝගය කොතරම් සාධාරණ දැයි සලකා බැලීම වටී.

මහේස්ත්‍රාත් අධිකරණය මගින් මෙම ඉල්ලුම්කරු නිදොස් හා නිදහස් කර තිබිය දී වෙනත් සාක්ෂිකරුවන් යොදා ගනිමින් මෙම විනය පරීක්ෂණය එනම් P3 හි චෝදනා පදනම් කොට පැවැත් වීම යුක්ති යුක්ත නොවේ. මහේස්ත්‍රාත් අධිකරණය ඉල්ලුම්කරු නිදොස් කොට පමණක් පැවතියේ නම් විනය පරීක්ෂණය පැවැත්වීමට ප්‍රතිපාදන තිබිය හැක. එහෙත් නිදොස් කොට නිදහස් කිරීම හේතුවෙන් විනය පරීක්ෂණය පැවැත්වීමට ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන මත ඉඩක් නොමැත. වෙනත් සාක්ෂිකරුවන් යොදා ගැනීමද හේතුයුක්ත නොවේ. එසේ වුවද විය යුතුව තිබුනේ අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රවාහන නිලධාරී යන දෙදනාට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්විය හැකිව තිබිණ කුමක් මතද? මහා මාර්ගයට යවන වාහන නියමිත රක්ෂණ ආවරණ නොමැතිව ධාවනයට යෙද වීම බරපතල ඝණයේ වරදකි. ඒ මත විනය පරීක්ෂණ පාලක වෙනත් පාර්ශවයකට එරෙහිව පැවැත්විය යුතුව තිබිණ.

නමුත් අභියාචනා මණ්ඩලය දඬුවම් ලිහිල් කොට "අංක 252 - 1153 දරන සංස්ථා වෑන් රථයේ අනතුර සම්බන්ධයෙන් රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූරණය නොකරන ලද රු.420,000/- ක මුදල සහ එම වාහනයට ගෙවන ලද දොඹකර ගාස්තු වන රු.12,000/-ක මුදල ඔබගේ වැටුපෙන් 40% සීමාවට යටත්ව අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ." යනුවෙන් දක්වා ඇත. එසේ වීමට හේතු වනුයේ ආයතනයේ විධිමත් විනයානුකූල කාර්ය සංග්‍රහයක් නොමැති වීමත්, ආයතනයේ නිලධාරීන් අන්තනෝමතික ලෙස ක්‍රියා කිරීමට ඉඩ කඩ තිබීමත් හේතුවෙන් ඉහත විනය නියෝග ඉදිරිපත් කිරීමට ඉඩ කඩ සැලසී තිබීමයි.

වරද, ආයතන සංග්‍රහයේ 27 ඡේදය අනුව පාලක මණ්ඩල වෙත සේවකයෙකුහට අධිකරණ ක්‍රියා මාර්ගයක් පවතින අතර තුර එකී වරද ආයතන සංග්‍රහයේ දැක්වෙන වරදක් වන කල්හි අධිකරණ කටයුතු වලට ස්වාධීන වශයෙන් දෙපාර්තමේන්තු විනය ක්‍රියා මාර්ග ගැනීමට ප්‍රතිපාදන ඇත. එහෙත් රූපවාහිනී සංස්ථාව ආයතන සංග්‍රහය ගුරු කොට පවත්වාගෙන යන බව මෙම නීති කෘත්‍ය තුළ කිසිම අවස්ථාවක සාක්ෂිකරුවන් හෙළි කොට නැත. කෙසේ වෙතත් ආයතනය විනය විභාගයක් පැවැත්වීම හා ඒ පැවැත් වූ චෝදනා මත දැඩි හා අචල දඬුවම් පැමිණ වීම හේතු යුක්ත නොවන බව තීරණය කරමි.

විනය පරීක්ෂණයේ ප්‍රතිඵල මත පනවන ලද දණ්ඩනයන්ගෙන් ඉල්ලුම්කරුගෙන් මුදල් අය කර ගැනීමට ගෙන තිබූ තීරණය අභියාචනා මණ්ඩලය මගින් ඉවත් කර තිබිණ. එහෙත් රියදුරු තනතුරේ ශ්‍රේණිය පහත දමා, කලින් ලබන ලද වැටුපද පහත දැමීමට ගන්නා ලද තීරණය එසේම පවතින බැව් ඉල්ලුම්කරු බේරුම්කරණයේ දී ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 11 බී ශ්‍රේණියේ රියදුරෙකු වශයෙන් සේවය කරමින් සිටිය දී කේ. එස්. විජේසේකර මහතා රිය අනතුරක් සම්බන්ධයෙන් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණ අංක 20678 දරන නඩු තීන්දුව මගින් නිදොස් කොට නිදහස් කර තිබිය දී එම සංස්ථාව විසින් නැවත විනය පරීක්ෂණයක් පවත්වා 2003.12.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රියදුරු 111 බී ශ්‍රේණියට පහත හෙළමින් අඩු වැටුප් පරිමාණයක පිහිටු වීම හේතුවෙන් ඔහුට අසාධාරනයක් සිදු වී ඇත. එය සනාථ කිරීමට මෙම ප්‍රදානය පුරාම ඉදිරිපත් කළ හා සාකච්ඡා කළ කරුණු සියල්ල ගෙන හැර දක්වා ඇත. තවද වගඋත්තරකාර ආයතනය විසින් පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරු ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ දැමීම රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2006.01.11 දිනැති ලිපිය ප්‍රකාරව සිදුකොට ඇත. එය එසේ සිදු නොවිනි යැයි ඔප්පු කිරීමේ භාරය වගඋත්තරකරුවන් වෙත පැවරී ඇත. එනමුත් එකී කාරණය උල්ලංඝණය වී නැතැයි වගඋත්තරකරුවන් මෙම විභාගයේ දී ඔප්පු කොට නැත.

එබැවින් ඔහුට යම් සහනයක් ලැබිය යුතුද යන්නට පිළිතුරු වනුයේ "ඔව්" යන්නය. එය කුමන ආකාරයේ සහනයක් විය යුතු ද? ඊට පිළිතුරු වනුයේ ඔහු 2003.12.10 දින පැවති තත්වයට ඔහුගේ උසස් වීම දීමනා, වැටුප් වර්ධක ආදිය සලකා ඉදිරියට ඒවා ලබා දිය යුතු බවය. ඉල්ලුම්කරු 11බී ශ්‍රේණියට පහත දැමූ දින සිට විජේසේකර මහතාට සෑම වර්ෂයකම ලැබිය යුතු වැටුප් වර්ධක ආදී දීමනා සහ උසස් වීම් ආදිය ද, ශ්‍රේණිය ද, ලබා දිය යුතු බවට

නිර්දේශ කරමි. තවද ඔහුට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය හේතු යුක්ත නොවන බවද නිගමනය කරමි. මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 30 ඇතුළත ඉල්ලුම්කරුට හිමි සියළුම වරප්‍රසාද, උසස්වීම්, හිඟ වැටුප්, අදාල ශ්‍රේණියේ ශ්‍රේණි ගත කිරීම හා ඊට අදාළ ආනුශංගික වෙනත් යම් දෙයක් වෙත්ද ඒවාද ලබා දීමට වගඋත්තරකාර ආයතනය පියවර ගත යුතුයයි මම නිගමනය කරමි.

මෙය යුක්තිසහගත හා සාධාරණ ප්‍රදානයක් බැව් සහතික කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ,
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2012 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

05-470

---

*මගේ අංකය* : IR/13/08/2008.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ, 2011.03.20 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි ජාතික සේවක සංගමය (පී. එම්. තිලක් පුෂ්පකුමාර) හා කොළඹ 05, කිරුල පාර, අංක 92 හී පිහිටි ලංකා සෝල්ට් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් , බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3367 දරන ප්‍රදානය 2011.10.19 දිනැති හා අංක 1728/11 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2012.03.06 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18 (1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 අප්‍රේල් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පී. එම්. තිලක් පුෂ්පකුමාර,
ජාතික සේවක සංගමය,
අංක 416, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

(ඉල්ලුම්කරු)

නඩු අංකය : ඒ –3367

සහ

ලංකා සෝල්ට් ලිමිටඩ්,
අංක 92, කිරුළ පාර,
කොළඹ 05.

(වගඋත්තරකරු)

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධ ප්‍රදානයේ අර්ථ නිරූපනයයි.

**ප්‍රදානය**

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 31(1) වගන්තිය ප්‍රකාරව අර්ථනිරූපනය සඳහා පාර්ශවයන්ගේ කැමැත්ත කලින් ලැබී ඇති බැවින් 2011.10.19 දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ මාගේ ප්‍රදානය සම්බන්ධයෙන් සංශෝධිත අර්ථ නිරූපනය මෙසේ ඉදිරිපත් කරමි.

ප්‍රදානයේ පළ වූ වැරදි සහගත ඡේදය පහත දැක්වේ. එනම්, "ඉල්ලුම්කරු 2003.05.10 දින සිට ගබඩා භාරකාර IV වැනි ශ්‍රේණියේ වර්ෂ 04 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම සැලකිල්ලට ගෙන 111 වන ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර මීළඟ උසස්වීම එළඹෙන දිනයේ සිට ලබා දීමට හා එසේ ලබා ගැනීමට මෙම බේරුම්කරණයේ දෙපාර්ශවය එකඟ වන හෙයින් ද" යන්න වෙනුවට මෙම අර්ථ නිරූපනයෙන් සංශෝධිත ඡේදය පහත දැක්වේ. එනම් "ඉහත අභියාචනයේ සඳහන් ඉල්ලුම්කරුගේ 2 වන ඉල්ලීම වන උසස් වීම ලබාදීම අතීතයට බලපාන ආකාරයට ලබාදීමට නොහැකි බවත්, කෙසේ වෙතත් අද දින සිට ඉල්ලුම්කරුගේ ඉදිරි සේවා තත්වය සලකා බලා මී ළඟ උසස්වීම ලබාදීමේදී ඉල්ලුම්කරුට කිසිම අගතියක් නොවන ආකාරයට යහපත් අයුරින් ඉල්ලුම්කරු සම්බන්ධව සලකා බලනු ලබන බවට පාලන අධිකාරිය විනිශ්චය සභාවට දැනුම් දී ඇති හෙයින්ද එසේ ලබා දීමටත්, ලබා ගැනීමටත් දෙපාර්ශවය එකඟ වන හෙයින් ද" යනුවෙන් අර්ථ නිරූපනය විය යුතු වේ.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ,
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2012 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

05-471

---

*මගේ අංකය* : IR/13/03/2008.

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 3(1)(ඈ) වගන්තිය යටතේ, 2008.11.28 දිනැති හා අංක 1577/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ

ප්‍රසිද්ධ කරන ලද, 2008.11.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හොරණ, කනන්විල, "පියනිවස" හි එම්. කේ. ඩී. පෙරේරා මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හී පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.03.06 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 අප්‍රේල් මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එම්. කේ. ඩී. පෙරේරා,
"පියනිවස", කනන්විල,
හොරණ.

(ඉල්ලුම්කරු)

නඩු අංකය : A–3266

*එරෙහිව*

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

(වගඋත්තරකරු)

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධ

**ප්‍රදානය**

ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වැනි පරිච්ඡේදය වන, කාර්මික ආරවුල් පනතේ (1957 අංක 62 හා අංක 4/1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික අණපනත් වල විශේෂ ප්‍රතිපාදන පනත්) වලින් සංශෝධිත 4(1) වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් විසඳීම සඳහා 2008.11.20 වෙනි දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

යථෝක්ත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල වශයෙන් කම්කරු කොමසාරිස්වරයා 2008.11.06 දිනැති සිය නිවේදනයෙහි මෙසේ සඳහන් කොට ඇත.

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ කළුතර ප්‍රාදේශීය කාර්යාලය යටතේ හොරණ ඩිපෝවට අනුයුක්තව දැනට සේවය කරන එම්. කේ. ඩී. පෙරේරා මහතාගේ වැඩ තහනම් කර තිබූ 1995.05.30 දින සිට 1997.05.12 දින දක්වා වූ කාලසීමාව සඳහා හිඟ වැටුප් ලබා ගැනීමට ඔහු හිමිකම් ලබන්නේ නම් හිඟ වැටුප් වශයෙන් ඔහුට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කුමක් විය යුතු ද යන්න පිළිබඳව වේ."

ආරම්භයේදීම දෙපාර්ශවය අතර පවත්නා ඉහත යොමුව සම්බන්ධයෙන් සමථයක් වේ නම් ඒ බැව් ගරු අධිකරණය වෙත දැනුම් දීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දෙන ලදී.

ඉල්ලුම්කරුගේ ආරවුල සම්බන්ධයෙන් හේතු දැක්වීම අනුව 95.05.30 දින බරපතල විෂමාචාරයක් කළ බවට චෝදනා කොට සේවය නතර කළ බවත්, ඉක්බිතිව පැවති විනය පරීක්ෂණයේ තමා නිදොස් කොට නිදහස් වුවද, 1997.05.07 දින කරුණු 2ක් යටතේ දඬුවමක් පමුණුවා ඇති බවත්, සේවය තහනම් කළ මාස තුනක (03) කාලය සඳහා හිඟ වැටුප් දඬුවමක් ලෙස නොගෙවන බව සැලකෙන බව දන්වා ඇතත්, එයට එරෙහිව අභියාචනයක් කිරීමේදී සියලු දඬුවම් ඉවත් කළ බවත් තමාට නොගෙවන ලද මාස 03ක හිඟ වැටුප් ලබා දීමට ක්‍රියා කරන ලෙසද බේරුම්කරුණයෙන් ඉල්ලා ඇත.

ඉල්ලුම්කරුගේ හේතු දැක්වීම කෙරෙහි පිළිතුරු පවසන වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය වූයේ ඉල්ලුම්කරු හොරණ ඩිපෝවේ සේවය කරමින් සිටියදී කරන ලද විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් චෝදනා පත්‍ර භාරදී වැඩ තහනම් කළ බවත් චෝදනා පත්‍රයේ 3 හා 5 යන චෝදනාවන්ට විධිමත් විනය පරීක්ෂණයේදී වරදකරු බවට පත්ව මාස 03ක සේවා තහනමක් සහිතව තරයේ අවවාද කිරීමක් කර ඇති හෙයින් ඊට එරෙහිව අභියාචනාවක් කර ඇති බවත්, අදාළ අභියාචනා මණ්ඩලයේ එකී අභියාචනා මණ්ඩලය සේවය තහනම් කර සිටි කාලය සඳහා වැටුප් ගෙවීමට තීරණයක් ගෙන නොමැති හෙයින් හිඟ වැටුප් නොගෙවන ලද බවටත් ප්‍රකාශ කර සිටී.

වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශයෙහි 11වැනි ඡේදයේ "එනම් තවද මෙම ඉල්ලුම්කාර සේවකයාගේ පූර්ව සේවා වාර්තාව අයහපත් බව එනම් මෙම සිද්ධියට අදාල කාලසීමාවට පෙර හා ඊට පසුව මේ දක්වා කාලසීමාව තුළ ආයතනයේ සිදු කළ විෂමාචාර ක්‍රියා සහ ඒ මත චෝදනා පත්‍ර නිකුත් කිරීමේ සහ දඬුවම් පැමිණිවීමේ වාර්තා කිහිපයක්ම ඇති බවත්, අවශ්‍ය වුව හොත් පසුව ඒවා ඉදිරිපත් කරන බවත් සඳහන් කරමු." යන මේ ප්‍රකාශයේ ගම්‍ය වන්නේ කුමක්ද? මේ සිද්ධියට පෙර හා පසු විෂමාචාර ක්‍රියාවන්හි ඉල්ලුම්කරු යෙදී ඇති බවත්. ඒවාට දඬුවම් ලබාදී ඇති බවත්, මේ විෂමාචාර හා දඬුවම් මේ අවස්ථාවේ දී ඉදිරිපත් නොකර පසුව ඉදිරිපත් කරමු යනු ඉල්ලුම්කාර සේවක මහතා බිය වැද්දීමක් හෝ තර්ජනය කිරීමක් වැනිය. එසේ ප්‍රකාශ කිරීම ඔහු බේරුම්කාර ක්‍රියාදාමයෙන් ඉවත් කිරීමට කිසියම් ව්‍යංග පියවරක් දැයි සැක සහිතය. වගඋත්තරකාර පාර්ශවය සේවයන් කෙරෙහි සුහදශීලීව නොහැසිරෙන සේයාවක් එම ප්‍රකාශය තුළ ඇත්දැයි සිතේ. සේව්‍ය සේවක සබඳතා මීට වඩා මිත්‍රශීලීව පවතින්නේ නම් මෙවැනි සිද්ධි අධිකරණය වෙත ඉදිරිපත් නොවීමට ඉඩ ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ හේතු දැක්වීමෙහි 10 වැනි ඡේදය ගත් කළ "ඉහත අභියාචනා විනය නියෝගය අනුව සේවය තහනම් කර සිටි කාලය සඳහා වැටුප් ගෙවීම ගැන තීරණයක් දී නොමැති බව සඳහන් කරමු." යන්නෙන් පැහැදිලි වනුයේ කුමක්ද,

ඉල්ලුම්කරු අභියාචනය කර සිටියේ තමාට එරෙහිව පනවන ලද දණ්ඩනයන්ගෙන් සහනයක් ලබා ගැනීම වේ. ඔහුට අභියාචන මණ්ඩලයෙන් හිඟ වැටුප් ඉල්ලීමට හේතුවක් නැත. පවත්නා සාමාන්‍ය

පරිචය වනුයේ යම් සේවකයෙකු යම් ක්‍රියාවක් සඳහා සේවය නතර කර ඇති කාලය වෙනුවෙන් හිඟ වැටුප් ගෙවීම, අදාළ චෝදනාවන්ගෙන නිදොස් හා නිදහස්වීම මත අදාල සේවා පක්ෂය කිසිත් විමසීමකින් තොරව සිදු කරන බවය. මෙහිදී වගඋත්තරකාර පර්ශවය විසින් සේවකයා නොඉල්ලන ලද සහනයක් අභියාචනා මණ්ඩලය නොසලකා හැර තිබීම සැලකිල්ලට ගෙන හිඟ වැටුප් ගෙවීම නතර කිරීමට වගඋත්තරකරුවන් යත්න දරා ඇති බව ගම්‍ය වේ.

වගඋත්තරකරුවන්ට මෙම හිඟ වැටුප් ගෙවීමේ ක්‍රියාව ඉතාමත් සරලව සිදු කළ යුතුව තිබුණි. එහෙත් එසේ සිදු නොකිරීමෙන් එම ගැටලුව බේරුම්කරණය දක්වා ඇද ගෙනවිත් ඇත. කාලය හා දෙපාර්ශවයේ වියදම් සලකා බලන විට මෙය එතරම් බරපතල කටයුත්තක් නොවේ.

තවද, ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ 18(1) වගන්තිය යටතේ මෙසේ දක්වා ඇත. එනම්, "අභියාචනය සාර්ථක වුවහොත් අභියාචනා විභාගයට පෙනී සිටීම නිසා සේවයට නොපැමිණි කාලය සේවයට පැමිණි කාලය ලෙස සලකන අතර එසේ නොපැමිණි දිනය හා දිනයන් සඳහා අභියාචනාකරුට පඩිය හෝ වේතන ගෙවනු ලැබේ." යනුවෙන් පැහැදිලිවම ලිඛිත ව්‍යවස්ථාව මග පෙන්වතත් ඒවා සැලකිල්ලට වගඋත්තකාර පාර්ශවය ගෙන නොමැත.

තවදුරටත් විනය ව්‍යවස්ථාවේ V වන වගන්තිය සලකා බලමු. බරපතල විෂමාචාර 34 ක් ලිඛිතව ඇත. ඒවා IV වගන්තියට අයත් වන අතර සේවය තහනම් කිරීමටද ඇතුළත් වේ. සාමාන්‍ය (බරපතල නොවන) විෂමාචාර 11කි. එය V වගන්තියට ඇතුලත් වන අතර එහිදී සේවය තහනම් කිරීමක් අපේක්ෂා නොකෙරේ. මෙම ඉල්ලුම්කරුට (V) වගන්තිය යටතේ දඬුවම් පමුණුවා ඇත. එසේ නම් සේවය නතර කර සිටි කාලයට හිඟ වැටුප් ගෙවීම සිදු කළ යුතුයැයි හැඟේ.

සමථයක් නොමැති බැවි 2009.12.18 දින හෙළිදරව් වූයෙන් විභාගය ආරම්භ කරන ලදී. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතිඥ ලයනල් මහතා පෙනී සිටි අතර ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත කොල්වින් පීරිස් මහතා පෙනී සිටියහ. ඉල්ලුම්කරු තම නඩුව ඉදිරිපත් කළේය. එනම් 1981.05.15 දින වගඋත්තරකාර පාර්ශවයේ සේවයට බැඳුණු බවත්, හොරණ ඩිපෝවේ සේවයේ යෙදී සිටියදී ත්‍රීෆෙස් මෝටරයක් අලුත්වැඩියා කිරීම සම්බන්ධව විෂමාචාරයක් සිදු කළ බවට චෝදනාවට ලක් වූ බවත්, 1995.05.30 සිට සේවය තහනමට කල් වූ බවත් විනය පරීක්ෂණයෙන් දඬුවම් ලද බවත් ඊට එරෙහිව අභියාචනය කළ බවත්, අභියාචනයෙන් ඉහත කී දඬුවම් බැහැර කළ බවද හිඟ වැටුප් ලබා ගැනීම සඳහා කම්කරු කොමසාරිස් කාර්යාලයේ පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව එය ගෙවීමට නියෝග ලද බවත්, එසේ නොගෙවූ බැවින් බේරුම්කරණය වෙත ඒමට සිදුවූ බවත්, මූලික ප්‍රශ්න හා හරස් ප්‍රශ්න වලදී හෙළිවිය. 2011.02.23 දින වගඋත්තරකරුවන් නැවතත් සමථයකට පැමිණීමට යෝජනා කරන ලදී.

ඉල්ලුම්කරුවන් සමථය සඳහා රු.82,483.32 ක මුදලක් ඉල්ලා සිටී. 1995 ජූනි සිට 1997 මැයි දක්වා මාස 24 ක් වෙනුවෙන් මූලික වේතනය, අතිරේක දීමනා හා ජීවන වියදම් අංකය ඇතුලත්ව මාස 24 ක් සඳහා රු.84,483.32 ක් ගණනය කර ඇත.

ඒ අනුව පූර්ණ හා අවසන් සමථයක් ලෙස රු.82,883.32 ක මුදලක් වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් එම්. කේ. ඩී. පෙරේරා වන මේ බේරුම්කරනයේ ඉල්ලුම්කරු වෙත ගෙවීමට එකඟ වේ. ඒ අනුව දෙපාර්ශවය නඩු ගොනුවේ අත්සන් කොට සමථය සඳහා එකඟත්වය පළ කරන ලදහ, එසේ හෙයින් සමථය සඳහා ඉඩකඩ ලැබෙන පරිදි මෙම ප්‍රදානය ලබා දෙන ලදී.

මෙය සත්‍ය හා සාධාරණ ප්‍රදානයක් වේ.

එස්. කාරියවසම්,
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2012 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

05-472

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.